15 හැවිරිදි බාලවයස්කාර සිසුවෙකුගේ නිවසට ගොස් ලිංගික අතවරයක් සිදු කළ බවට චෝදනා පිට, ගුරුවරියක් අත්අඩංගුවට ගැනුණු පුවතක් මාධ්‍ය තුළ (දෙසැම්බර් 02, 2022) අවධානයට යොමු වී තිබිණි. එහිදී තෝරාගත් සිංහල භාෂා පුවත්පත් කිහිපයක මෙම පුවත ඉදිරිපත් කර තිබූ ආකාරයන් මෙසේ දැක්විය හැක.

* "සුදූ ඔයා පුසුඹයි කියා 43 ටීචර් ගෙට පැන, 15 සිසුවා බදාගෙන" - අරුණ (සිරස්තලය සමඟ කාටූනයක් ද දක්වා ඇත)

* "ඔයා ගාව හරි සුවඳයි, ගෙදරටම ගොස් සිසුවාට උම්මා දුන් ටීචර් රිමාන්ඩ්" - දිනමිණ (සිරස්තලය සමඟ කාටූනයක් ද දක්වා ඇත)

* "15 හැවිරිදි සිසුවෙකුව සිප අතවර කළ බව කියන ගුරුවරියක් රිමාන්ඩ්" - අද

1) මෙවැනි පුවතක් හැඟීම් කළඹවන සුළු (sensationalised) ආකාරයෙන් දැක්වීම කෙතරම් යෝග්‍ය ද?

2) අරුණ සහ දිනමිණ සිරස්තල සමග දැක් වී ඇති කාටුනයන් පිළිබඳ ඔබේ අදහස කුමක්ද? එම කාටුනයන් හැඟීම් කළඹවන සුළු ආකාරයෙන් දැක්වී ඇතැයි ඔබ නොසිතන්නේද ? එම කාටුනයන් ඔස්සේ කාන්තාව ඒකාකෘතික කර දැක්වීමක් ද (stereotyping) සිදු නොවන්නේද?

3) බාලවයස් ලිංගික අතවරයක් යනු නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. එම වරදෙහි සැබෑ බරපතළ භාවය දැක්වෙන පරිදි පුවත ඉදිරිපත් කර ඇති සිරස්තල(ය) ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?

4) ඒ වෙනුවට, මෙවැනි පුවතක නිසි බරපතලකම සමාජයට සන්නිවේදනය කිරීම මාධ්‍ය වගකීමක් නොවන්නේ ද?

5) ඒ අනුව වඩාත් යෝග්‍ය පුවත ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය ([https://forms.gle/u5a5n5dJPDerh3Le7](https://forms.gle/u5a5n5dJPDerh3Le7)) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.